සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 88 - නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# 88 - නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය

## එක් එක් ප්‍රශ්නයේ ලකුණු බෙදීයාම පිළිබඳ සාරාංශය

**I පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් යුක්තය. නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 40 කි.

**II පත්‍රය**

| | | |
|---|---|---|
| 1. පිළිතුර (අනිවාර්යයි) සඳහා | - | ලකුණු 20 |
| 2. පිළිතුර සඳහා | - | ලකුණු 10 |
| 3. පිළිතුර සඳහා | - | ලකුණු 10 |
| 4. පිළිතුර සඳහා | - | ලකුණු 10 |
| 5. පිළිතුර සඳහා | - | ලකුණු 10 |
| 6. පිළිතුර සඳහා | - | ලකුණු 10 |
| 7. පිළිතුර සඳහා | - | ලකුණු 10 |

| | | |
|---|---|---|
| I පත්‍රයට | - | ලකුණු 40 |
| II පත්‍රයට 1 පිළිතුර | - | ලකුණු 20 |
| 2 සිට 7 දක්වා තෝරාගත් පිළිතුරු 4 x 10 | - | ලකුණු 40 |
| | | ලකුණු 100 |

# I පත්‍රයේ අභිමතාර්ථ

1. ත්‍රිකෝණ හා චතුරස්‍ර හඳුනා ගනියි.
2. ඉලිප්සයේ මහා අක්ෂය හා සුළු අක්ෂ විස්තර කරයි.
3. වෘත්තයක කොටස් හඳුනා ගනියි.
4. තල රූපවල ලක්ෂණ පැහැදිලි කරයි.
5. ප්‍රක්ෂේපන ක්‍රම අවබෝධ කර ගනියි.
6. ඉලිප්සයේ කොටස් නම් කරයි.
7. ස්පර්ශකය හා පරිමාණ හඳුනා ගනියි.
8. කෝණ නිර්මාණය කරයි.
9. ද්‍රව්‍යවල භෞතික ගුණ හඳුනා ගනියි.
10. ද්‍රව්‍යවල ගුණ භාවිතා කරයි.
11. භංගුරතාවයේ ගුණ ප්‍රදර්ශනය කරයි.
12. දැවවල තෙතමනය මැන බලයි.
13. ගඩොලක ස්කන්ධය පහැදිලි කරයි.
14. සියුම් සමාහාර වර්ගීකරණය කරයි.
15. කොන්ක්‍රීට් මිශ්‍රණයක් හඳුනා ගනියි.
16. දැවවල ස්වභාවික ගුණ ප්‍රකාශ කරයි.
17. ද්වි බීජ පත්‍ර ශාකයක ලක්ෂණ හඳුනා ගනියි.
18. දැව දෝෂ නම් කරයි.
19. දැව ගබඩා කිරීමේ දී ඇතිවන දෝෂ විස්තර කරයි.
20. දැව පදම් කිරීම විස්තර කරයි.
21. දැව සංරක්ෂණ ක්‍රම විස්තර කරයි.
22. ගඩොලයක නියමිත මිනුම් හඳුනා ගනියි.
23. මැටිවල ගුණ හඳුනා ගනියි.
24. කොන්ක්‍රීට් මිශ්‍රණ නියමිත ස්ථාන සඳහා භාවිත කරයි.
25. පෙදරේරු කර්මාන්තයේ උපකරණ හඳුනා ගනියි.
26. භාවිතයෙන් ඉවත් වන ආවුද සහ උපකරණ නම් කරයි.
27. ආමාන පෙට්ටියේ ප්‍රමාණ හඳුනා ගනියි.
28. ආවුද මුවහත් කෝණ විස්තර කරයි.
29. බලවේග උපකරණවල කාර්යක්ෂමතාව පැහැදිලි කරයි.
30. බලවේග ආවුද උපකරණ ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගනියි.
31. දැව මුට්ටු වර්වල භාවිතය පැහැදිලි කරයි.
32. බදාම මිශ්‍රණ පිළිබඳ කරුණු දක්වයි.
33. ආරුක්කුවේ කොටස් නම් කරයි.
34. නළ රීමරයේ භාවිතය හඳුනා ගනියි.
35. ජලනළ උපාංග භාවිතය පැහැදිලි කරයි.
36. ජලනළ සම්බන්ධ කිරීමේ දැනුම භාවිත කරයි.
37. දැවයක වර්ග ඵලය ගනනය කරයි.
38. ජාතික වෘත්තිය සහතිකය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
39. ගඩොල්වල දෝෂ නම් කරයි.
40. ආවුද හා උපකරණවල භාවිතය පිළිබඳ කුසලතාව විදහා දක්වයි.

රහස්‍යයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2023 (2024)**
**க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2023 (2024)**

විෂයය අංකය / பாட இலக்கம்: **88**

විෂයය / பாடம்: **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය**

## I පත්‍රය - පිළිතුරු
## Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 1. | 1, 2, 4 | 11. | 1 | 21. | 2 | 31. | 2 |
| 2. | 4 | 12. | 1 | 22. | 1 | 32. | 3 |
| 3. | 1 | 13. | 2 | 23. | 3 | 33. | 4 |
| 4. | 3 | 14. | 3 | 24. | 3 | 34. | 1 |
| 5. | 3 | 15. | 3 | 25. | 3 | 35. | 2 |
| 6. | 3 | 16. | 2 | 26. | 4 | 36. | 1, 2, 4 |
| 7. | 2 | 17. | 2 | 27. | 3 | 37. | 4 |
| 8. | 3 | 18. | 4 | 28. | 2 | 38. | 3 |
| 9. | 3 | 19. | 4 | 29. | 2 | 39. | 1 |
| 10. | 2 | 20. | 3 | 30. | 1 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **01×40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

**නිවැරදි පිළිතුරු සංඛ්‍යාව** / சரியான விடைகளின் தொகை: 25 / 40

**I පත්‍රයේ මුළු ලකුණු** / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**88 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

**නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය I, II**
வடிவமைப்பும் நிருமாணத் தொழினுட்பவியலும் I, II
Design and Construction Technology I, II

## නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය II

※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) පහත දී ඇති සමාංශක රූපය බලන්න.
සෘජු ප්‍රක්ෂේපණ මූලධර්මයේ තෙවන කෝණ ක්‍රමය අනුගමනය කරමින් දී ඇති මිනුම්වලට අනුව සම්පූර්ණ පරිමාණයට පහත සඳහන් *A*, *B* සහ *C* පෙනුම් අඳින්න.
(මිනුම් දී ඇත්තේ මිලිමීටරවලිනි)

*A* ඊතලය දෙසින් පෙනෙන ඉදිරි පෙනුම

*B* ඊතලය දෙසින් පෙනෙන පැති පෙනුම

*C* ඊතලය දෙසින් පෙනෙන සැලැස්ම




(ii) ඔබ කැමති මිනුම් ගෙන විෂම පාද ත්‍රිකෝණයක් ඇඳ එහි පරිවෘත්තය නිර්මාණය කරන්න. ඔබ යොදාගත් මිනුම් ඒ ඒ පාදයට අදාළ ව සටහන් කරන්න.

01. (i)



(ii)



01. (i) ලකුණු ලබා දීම

- ඉදිරි පෙනුම
  1. වක්‍ර රේඛාව — ලකුණු 01
  2. මධ්‍ය ලක්ෂය — ලකුණු 01
  3. ආනත රේඛාව — ලකුණු 01
  4. වමේ — ලකුණු 01

  ලකුණු 04

- පැති පෙනුම
  1. සැඟි රේඛාව — ලකුණු 01
  2. මැද තිරස් රේඛාව — ලකුණු 01
  3. වටේ — ලකුණු 01

  03

- සැලැස්ම ඇඳීම
  1. සැඟි රේඛාව — ලකුණු 01
  2. මැද තිරස් රේඛාව — ලකුණු 01
  3. මැද සිරස් රේඛාව — ලකුණු 01

  03

- වෙනත්
  1. දිග, පළල,උස ඇක්වෙන් ලෙස මිනුම් 03 ට — ලකුණු 01
  2. තෙවන කෝණ ක්‍රමයට — ලකුණු 01
  3. අවම වශයෙන් නම් කිරීම් 02 කට — ලකුණු 01

  03

මුළු ලකුණු 15

01. (ii) ලකුණු ලබා දීම

ත්‍රිකෝණ නිර්මාණය — ලකුණු 02 යි.

මිනුම් තුනම ලකුණු කිරීමට ලකුනු 01 බැගින් — ලකුණු 03 යි

ලකුණු 05 යි

- **පළමු වන ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 20 කි.**

**2.** දෙමහල් නිවසක බිම් මහල සකස් කර පළමු මහල සඳහා කොන්ක්‍රීට් ගෙබිම අතුරා බිම් මහලේ නේවාසිකයින් පදිංචි වී ඇත. කෙටි කාලයක දී පළමු මහලේ කොන්ක්‍රීට් තට්ටුව හරහා නිවස තුළට ජලය කාන්දුවන බව නිරීක්ෂණය විය.

(i) මෙවැනි පරිසරයක ඇති විය හැකි අවාසිදායක තත්ත්වයන් **දෙකක්** නම් කරන්න.

(ii) එම තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා පළමු මහලේ ගෙබිම පෙදරේරුමය ක්‍රම භාවිතයෙන් නිමහම් කිරීමට සුදුසු නිමහම් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(iii) ඔබ ඉහත (ii) හි සඳහන් කළ **එක්** නිමහම් ක්‍රමයක් සිදු කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(i)

- අභ්‍යන්තරයේ යොදා ඇති වැරගැන්නුම් කම්බි දිරාපත් වීම නිසා කොන්ක්‍රීටයේ ශක්තිය දුර්වල වීම
- නිවසේ පවතින භාණ්ඩවලට හානි වීම.
- නිවසියන්ගේ සෞඛ්‍ය ආරක්ෂාවට බලපෑම් ඇති වීම
- නිවසේ කොටස් දුර්වර්ණ වීම

***(එක් කරුණක් සඳහා 01 බැගින් ලකුණු 02 යි.)***

(ii)

- ජල කාන්දු වළක්වන ආලේපනයක් ගල්වා බදාම ඇතිරීම
- සිමෙන්ති වැලි මිශ්‍රණයෙන් බදාම අතුරා සිමෙන්ති සුද මැදීම
- ජලය ඉක්මනින් බැස යාමට සුදුසු පරිදි මතුපිට සකස් කිරීම
- ජලය කාන්දු නොවන ද්‍රව්‍ය ඇතිරීම, ඇලවීම හෝ ආලේප කිරීම

***(එක් කරුණකට එක බැගින් කරුණු 02 යි)***

(iii) ආලේප කිරීම/ඇතිරීම/ ඇලවීම ගැන පැහැදිලි කර ඇත්නම් ***(ලකුණු 02)***

නිමහම් කිරීම පැහැදිලි කිරීමට ***(ලකුණු 02)***

***(මුළු ලකුණු 10 යි)***

**3.** ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බැඳුම් ද්‍රව්‍යයක් ලෙස පිලිස්සූ හුනු ද භාවිත කරයි.

(i) හුනු නිෂ්පාදනය සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය **තුනක්** නම් කරන්න.

(ii) හුනුගල් පිලිස්සීමේ දී සිදුවන රසායනික ප්‍රතික්‍රියාව ලියන්න.

(iii) පිලිස්සූ හුනුගල් ගබඩා කිරීමේ දී සහ ප්‍රවාහනයේ දී අනුගමනය කළ යුතු ආරක්ෂිත පියවර **එක** බැගින් සඳහන් කර එයට හේතුව සඳහන් කරන්න.

(i) බෙලි කටු, සිප්පි කටු, ස්පටික හුණු ගල් (ඩොලමයිට්)

***(එක් පිළිතුරුකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)***

(ii) $CaCo_3 \xrightarrow[\Delta]{} Cao + Co_2\uparrow$

***(නිවැරදි ප්‍රතික්‍රියාවට ලකුණු 03 යි)***

(iii) ප්‍රවාහනයේදී ආරක්ෂිත පියවර,

- ආවරණය කර ප්‍රවාහනය කිරීම

  හේතුව : හුණු අංශු පරිසරයට එකතු වීම වැළැක්වීමට.

  තෙත මනයෙන් ආරක්ෂා කිරීමට

  ගබඩා කිරීමේ දී ආරක්ෂිත පියවර

- තෙතමනයෙන් ආරක්ෂා කිරීම, දැව මත මලු වශයෙන් ගබඩා කිරීම, ආවරණය කර තිබීම

  හේතුව : ජලය සමග මිශ්‍ර වීමේදී පිටවන අධික තාපයෙන් හානි ඇති වීම

***(එක් ආරක්ෂිත පියවරක් සඳහා ලකුණු 01 බැගින් ලකුණු 02 යි)***

***(එක් හේතුවකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)***

***(මුළු ලකුණු 10 යි)***

**4.** පහත රූපයේ දැක්වෙන්නේ ඇලුමිනියම් රාමුවක් භාවිත කර සකස් කළ දොර පියනකි.




(i) දොර පියනේ A සහ B වලින් පෙන්වා ඇති මුහුණත් දෙක සඳහා භාවිත කළ හැකි ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(ii) A සහ B සඳහා භාවිත කළ හැකි ද්‍රව්‍ය ඇලුමිනියම් රාමුව තුළ හිරකර රඳවා ගැනීමට භාවිත කරන ද්‍රව්‍යය කුමක් ද?

(iii) දොර, ජනේල, වෙන්කිරීම් ආදී ඉදිකිරීම් ව්‍යුහ සඳහා ඇලුමිනියම් භාවිතා කිරීමේ වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** දැවවලට සාපේක්ෂව සඳහන් කරන්න.

(i) වීදුරු, කැලැඩින්, සින්ක් ඇලුමිනියම් තහඩු, කෘතිම දැව, කාඩ්බෝඩ්

**(එක් ද්‍රව්‍යකට ලකුණු 02 බැගින් ලකුණු 04 යි)**

(ii) රබර්බිඩින් (ඇලුමිනියම් පිරි සැකසුම් පටි)

**(ලකුණු 02යි)**

(iii)

| වාසි | අවාසි |
|---|---|
| • සැහැල්ලු බව | ඇඳවීම් සහ පලුදු වීම |
| • කල් පැවැත්ම | වර්ණ ගැන්වීම අපහසුයි |
| • දිරාපත් නොවීම | නිමහම් කිරීමෙන් පසු සියුම් දාර අනතුරු දායක වීම |
| • සපයා ගැනීම පහසු වීම | |
| • එකලස් කිරීමේ පහසුව | |

**(වාසි එකක් සඳහා ලකුණු 01 බැගින් ලකුණු 02 යි)**

**(අවාසි එකක් සඳහා ලකුණු 01 බැගින් ලකුණු 02 යි)**

**(මුළු ලකුණු 10 යි)**

5. දැව භාණ්ඩ නිෂ්පාදනයේ දී භාවිත කරන ප්‍රධාන අමුද්‍රව්‍ය වන්නේ ශාක කඳන් ඉරාගැනීමෙන් ලබාගන්නා දැව වේ.

(i) ස්වාභාවික දැවවල ඇති ගුණාංග **දෙකක්** ලියන්න.

(ii) ඒකබීජ පත්‍ර ශාකයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** ලියන්න.

(iii) ද්විබීජ පත්‍ර ශාක කඳක හරස්කඩක් ඇඳ පහතින් දක්වා ඇති දෑ ලකුණු කරන්න.

(අ) පිට පොත්ත

(ආ) ඇතුළු පොත්ත

(ඇ) අරටුව

(ඈ) ඉරිමදය

(i)

- වර්ණය, අලංකාරය, කම්පණවලට ඔරොත්තු දීම, ශක්තිය, කල්පැවැත්ම, දැඩි බව, විවිධත්වය

**(ලකුණු 01 බැගින් ලකුණු 02 යි)**

(ii)

- අතු නොබෙදෙන සෘජු කඳක් තිබීම
- පත්‍ර පටුව හා දික්ව පිහිටීම
- පත්‍ර නාරටි සමාන්තරව පිහිටීම
- මල් පෙති තුන හෝ තුනේ ගුණාකාර ලෙස පිහිටීම
- තන්තු මූල පද්ධතියකින් පොලවට සම්බන්ධ වීම
- අරටුව පිටත සිට අභ්‍යන්තරයට වර්ධනය වීම

**(ලකුණු 01 බැගින් ලකුණු 02 යි)**

(iii)



01. පිට පොත්ත - Outer bark

02. ඇතුළු පොත්ත - Inner bark

05. අරටුව - Heart wood

06. දැව මදය - Pith

**(රූපයට ලකුණු 02 යි. නම් කිරීමට ලකුණු 01 බැගින් ලකුණු 02**

**(මුළු ලකුණු 10**

6. පාසලේ ගෘහ විද්‍යාගාරය සඳහා මීටර 1 පළල, මීටර 2 ක් දිග හා මීටර 0.75 උස කෑම මේසයක් සකස් කිරීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පහත දක්වා ඇත.

- මේස කකුල් සඳහා 75 mm × 75 mm හරස්කඩ සහිත දිග 750 mm දැව කැබලි 04 යි.
- රාමුව සඳහා ඝනකම 25 mm පළල 150 mm හා දිග 1 m වන ලෑලි 02 යි.
- රාමුව සඳහා ඝනකම 25 mm පළල 150 mm හා දිග 2 m වන ලෑලි 02 යි.
- මේස කට්ටුව සඳහා ඝනකම 25 mm හා පළල 200 mm වන දිග 2 m වන ලෑලි කැබලි 05 යි.
- මතුපිට ලෑල්ල සවි කිරීමට කලම්ප සඳහා ඝනකම 25 mm පළල 75 mm දිග 1 m ලෑලි කැබලි 03 යි.
- කලම්ප සවි කිරීම සඳහා 38 mm කම්බි ඇණ 200 g ක් අවශ්‍ය වේ.

75 mm × 75 mm දැව දික් මීටරයක් රු. 400.00 කි.
ඝනකම 25 mm ලෑලි ව.මී. 1 ක් රු. 500.00 කි.
මේසය සකස් කිරීම සඳහා වඩු කාර්මික කුලිය රු. 10000.00 ක් වේ.
38 mm කම්බි ඇණ 1 kg ක් = රු. 400.00 කි.

මේසය සකස් කිරීම සඳහා අවශ්‍ය මුළු වියදම ගණනය කරන්න.

06. (i) 75 x 75 දැව $750 \times 4 = 3000 \text{ mm} = 3 \text{ m}$

රාමුවට දැව $\frac{150}{1000} \times 1 \times 2 = 0.3 \text{ m}^2$

ලෑල්ල $\frac{150}{1000} \times 2 \times 2 = 0.6 \text{ m}^2$

$\frac{200}{1000} \times 2 \times 5 = 2.0 \text{ m}^2$

$\frac{75}{1000} \times 1 \times 3 = \underline{0.225 \text{ m}^2}$

$\underline{\underline{3.125 \text{ m}^2}}$

ඇණ සඳහා $\frac{400}{10} = 40 \times 2 =$ රු. 80/-

- 75 x 75 කකුල් සඳහා 3 x 400 = 1200.00

  ලෑලි සඳහා 3.125 x 500 = 1562.50

  ඇණ සඳහා = 80.00

  වැඩ කුලිය = 10000.00

  මුළු මුදල = 12842.50

- මේස කකුල් සඳහා දැව ප්‍රමාණය ගණනය කිරීම *(ලකුණු 01 යි)*
- මේස රාමුව සඳහා දැව ප්‍රමාණය ගණනය කිරීම *(ලකුණු 01 යි)*
- මේස තට්ටුව සඳහා දැව ප්‍රමාණය ගණනය කිරීම *(ලකුණු 01 යි)*
- කලම්ප සඳහා දැව ප්‍රමාණය ගණනය කිරීම *(ලකුණු 01 යි)*
- 75 x 75 දැව සඳහා මිල ගණනය කිරීම *(ලකුණු 01 යි)*
- 25mm දැව සඳහා මිල ගණනය කිරීම *(ලකුණු 02 යි)*
- ඇණ සඳහා මිල එකතු කිරීම *(ලකුණු 01 යි)*
- වැඩ කුලි එකතු කිරීම *(ලකුණු 01 යි)*
- අවසන් නිවැරදි පිළිතුරට *(ලකුණු 01 යි)*

*(ලකුණු 10 යි)*

***(මුළු ලකුණු 10 යි)***

7. රූපසටහන් දක්වමින් පහත සඳහන් උපකරණවලට කෙටි සටහන් ලියන්න.
   (i) වානේ කෝදුව
   (ii) ස්වාය මට්ටම් ලෑල්ල
   (iii) කුඩුම්බි වරක්කලය
   (iv) ලඹය
   (iv) මිනුම් පෙට්ටිය

(i) වානේ කෝදුව

- මල නොබැඳෙන වානේවලින් නිෂ්පාදිතයි.
- මිනුම් ගැනීම සඳහා අවශ්‍ය මිනුම් සලකුණු කර ඇත.
- කාර්මික ඇඳීමේ දී මිනුම් ගැනීමට බහුලව භාවිතා කෙරේ.



***(රූප සටහන සඳහා ලකුණු 01 යි. විස්තර කිරීම සඳහා ලකුණු 01 යි)***

(ii) ස්වාය මට්ටම් ලෑල්ල

ගැමි වහාරේ කණ මට්ටම් ලෑල්ල ලෙස ද හඳුන්වන මෙම උපකරණය ලී වැඩ කර්මාන්තයේ ඕනෑම කෝණයක් සලකුණු කර ගැනීම සඳහා භාවිතා කරයි.

කත්තුමල්ලි මූට්ටුව ඇඳීම සඳහා විශේෂයෙන් භාවිතා කෙරේ.



*(රූප සටහන සඳහා ලකුණු 01 යි. විස්තර කිරීම සඳහා ලකුණු 01 යි)*

(iii) කුඩුම්බි වරක්කලය

දැව කර්මාන්තයේ දැවයක දාරයට සමාන්තරව එකවිට රේඛා දෙකක් ඇඳීම සඳහා මෙම උපකරණය භාවිතා කරයි. සිරු මාරු කළ හැකිය.

උදා : කුඩුම්බි සලකුණු කිරීම



*(රූප සටහන සඳහා ලකුණු 01 යි. විස්තර කිරීම සඳහා ලකුණු 01 යි)*

(iv) ලඹය

පෙදරේරු කර්මාන්තයේදී ව්‍යුහවලසිරස් බව පරීක්ෂා කිරීම සඳහා මෙම උපකරණය භාවිතා කරයි. මැකිලිය, බරුව සහ නූල යන කොටස් තුනෙන් සමන්විත වේ.



*(රූප සටහන සඳහා ලකුණු 01 යි. විස්තර කිරීම සඳහා ලකුණු 01 යි)*

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

(v) මිනුම් පෙට්ටිය

ඉදිකිරීම් කර්මාන්තයේ සමාහාර (ගල්, වැලි) හා බැඳුම් ද්‍රව්‍ය මැන ගැනීම සඳහා භාවිතා කරයි.



*(රූප සටහන සඳහා ලකුණු 01 යි. විස්තර කිරීම සඳහා ලකුණු 01 යි)*

*(මුළු ලකුණු 10 යි)*

WWW.PastPapers.WiKi

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න